# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1691/10 - 2011 පෙබරවාරි 01 වැනි අඟහරුවාදා - 2011.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය

**බස්නාහිර පළාත ඇතුළත කෘෂිකාර්මික, කාර්මික, වානිජ්‍ය හා වෙළෙඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම, පිහිටුවීම හා ඒවායේ නිරතවීම සඳහා ද, කාර්මික හා ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා ද, විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයක් පිහිටුවීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික සියලු කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ද වූ ප්‍රඥප්තියකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මේ ප්‍රඥප්තිය "බස්නාහිර පළාතේ, 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය" වශයෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

I වන කොටස

***බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයක් පිහිටුවීම සහ එහි සංයුතිය***

ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය පිහිටුවීම

2. (1) මෙහි මින් මතු "කාර්යාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාංශයක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2)කාර්යාංශය (1) වන උප වගන්තියේ ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද ඒ නාමයෙන් කාර්යාංශය විසින් නඩු පැවරීම සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබීමද කරනු ලැබිය හැකි ය.

කාර්යාංශයේ සාමාජිකයින්

3. කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් කාර්යාංශයේ සාමාජිකයින් විය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලය

4. (1) කාර්යාංශයේ මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් විය යුතු අතර, එය අමාත්‍යවරයා මගින් පත්කරන පහත දැක්වෙන සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු යඃ-

(අ) (i) බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් නම් කරනු ලබන තැනැත්තෙකු ;

(ii) බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුල්‍ය ;

(iii) බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සැලසුම් ;

(ආ) කාර්යාංශයේ බහු ක්‍රියාකාරි අංශ පිළිබිඹු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් පත්කකරනු ලබන මෙහි මින් මතු .පත්කළ සාමාජිකයන්, ලෙස හඳුන්වනු ලබන කෘෂිකාර්මික, කාර්මික. වානිජ්‍ය හා වෙළඳ ව්‍යවසාය, නීතිය හෝ යන ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි, සැලසුම් සම්පාදනය, රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයෝජනය කටයුතු, විදේශ ආධාර ආයතනය සමඟ කටයුතු කිරීමේ හැකියාව හා පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරින් පත් කරනු ලබන සාමාජිකයන් හතර දෙනෙකු.

(2) යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තුවේ, යම් පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයකු නම් හෝ වේ නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේනම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම නතර වන්නේ නම්;

සාමාජිකයකු වීමට නුසුදුසුකම්

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටී නම් හෝ සිටියේ නම් හෝ ;

(ඉ) විෂමාචාරය නිසා කාර්යාංශයේ සාමාජිකත්වයෙන් ඉවත් කර ඇත්නම්;
කාර්යාංශයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කිරීමට සුදුස්සෙකු නොවිය යුතු ය.

(3) සෑම පත් කළ සාමාජිකයකු ම, ඔහු කලින් ඉල්ලා අස්වුවහොත්, මියගියහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(4) අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් පත් කළ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) ඉල්ලා අස්වීමෙන් හෝ තම ධුර කාලය ඉකුත්වීමෙන් හෝ තම ධුරය හිස් කරන පත් කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(6) (අ) කාර්යාංශයේ පත් කල සාමාජිකයකුගේ ක්‍රියා කලාපය පිළිබඳ සෑහිමකට පත් නොවන විට ඔහුව ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත් කළ සාමාජිකයකු, අධ්‍යක්ෂවරයෙකු වශයෙන් හෝ වෙනත් යම් තත්වයකින් කාර්යාංශයෙහි සේවය කිරීම හෝ නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙකු නොවිය යුතු ය.

(7) (අ) තම ධුර කාලය ඉකුත්වීමෙන් නොව අන්‍යාකාරයකින් පත් කල සාමාජිකයකු තම ධුරය හිස් කළහොත්, අමාත්‍යවරයා විසින්, (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන කෙරෙහි සැලකිල්ල ඇතිව, එසේ ධුරය හිස් කරන පත් කල සාමාජිකයකු වෙනුවට වෙනත් යම් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ පත් කරන ලද යම් පත් කළ සාමාජිකයකු තම ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ තම ධූරය දැරිය යුතු ය.

(8) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් හෝ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයෙකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඒ නොහැකියාවේ හෝ බැහැරව සිටීමේ කාලය තුළ හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

5. අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරය සහ අනුප්‍රමාණය අනුව කාර්යාංශයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

*කාර්යාංශයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම*

6. කාර්යාංශය විසින් ඇති කරන ලද හෝ ඇති කිරීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව කෙලින්ම හෝ අනියම් ලෙස සම්බන්ධතාවයක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමකදී හෙළි කළ යුතු ය. ඒ හෙළි කිරීම මණ්ඩලයේ වාර්තාවේ වාර්තා කරනු ලැබිය යුතු අතර ඒ අධ්‍යක්ෂවරයා ඒ ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය.

*කාර්යාංශය ඇති කිරීමට යෝජිත ගිවිසුමක් පිළිබඳ සම්බන්ධතාව කාර්යාංශයේ සාමාජිකයින් හෙළි*

එසේ වුවද, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු වශයෙන් හෝ රාජ්‍ය සංස්ථාවක අධ්‍යක්ෂවරයකු වශයෙන් ගිවිසුමක් පිළිබඳව කාර්යාංශයේ යම් අධ්‍යක්ෂවරයකුට තිබිය හැකි සම්බන්ධතාව මේ වගන්තියේ අර්ථානුකූලව සම්බන්ධතාවක් ලෙස සලකනු නොලැබිය යුතුය.

7. මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් හතර දෙනෙකු සිටිය යුතුය. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වලදී කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

*මණ්ඩලයේ රැස්වීම්වල ගණ පූර්ණය හා කාර්ය පටිපාටිය විධිමත් කිරීම*

8. මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් අතර යම් පුරප්පාඩුවක් හෝ යම් අධ්‍යක්ෂවරයකුගේ පත්වීම පිළිබඳ වූ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

*මණ්ඩලයේ කටයුතුවල වලංගුභාවය*

9. මණ්ඩලය විසින් කාර්යාංශයේ කටයුතු පරිපාලනය කළ යුතු අතර, ඒ කාර්ය සඳහා කාර්යාංශයේ සියලු බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

*මණ්ඩලයේ සාමාජිකයින් එහි කටයුතු පරිපාලන කළ යුතු බව*

10. කාර්යාංශයේ කටයුතු කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා අවශ්‍ය ස්වකීය බලතල සහ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් සභාපතිවරයාට, අධ්‍යක්ෂවරයකුට හෝ කාර්යාංශයේ හෝ කාර්යාංශයේ සේවා නියුක්තිකයකුට පවරා දිය හැක්කේ ය.

*මණ්ඩලයේ බලතල සහ කාර්ය පැවරීම*

11. (1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයන් අතුරින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(2) රෝගාතුරුවීමෙන් හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් හෝ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වෙතොත් ඔහු වෙනුවට ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සියලු රැස්වීම්වල දී සභාපතිවරයා මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමක දී සභාපතිවරයා පැමිණ නොසිටිය හොත්, පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින්, ඒ රැස්වීමේ මූලාසනය දැරීමට ඔවුන් අතුරින් එක් අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගත යුතු ය.

*මණ්ඩලයේ සභාපතිවරයා*

(4) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින්, සභාපතිවරයාගේ ක්‍රියාකලාපය පිළිබඳ සෑහීමකට පත් නොවන විට සභාපතිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකි ය.

(6) (4) වන සහ, (5) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය මන්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුර කාලය විය යුතු ය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක සභාපතිවරයාට තමාගේම ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

12. (1) කාර්යාංශයේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ හෝ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ කාර්යාංශයේ යම් නිලධරයකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් කාර්යාංශයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

කාර්යාංශයේ මුද්‍රාව

(3) අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ඉදිරිපිට හෝ අධ්‍යක්ෂවරයන් දෙදෙනකුට පැමිණ සිටිය නොහැකි අවස්ථාවක එක් අධ්‍යක්ෂවරයකු සහ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු ඉදිරිපිට හැර, කාර්යාංශයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ඒ අධ්‍යක්ෂවරයන් හා නිලධාරියා විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනයකට නොතැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ඒ අධ්‍යක්ෂවරයන් හා නිලධාරියා විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

කාර්යාංශය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල

13. කාර්යාංශයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් කාර්යාංශයට ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර කාර්යාංශය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතු ය.

## II වන කොටස

කාර්යාංශයේ පරමාර්ථ හා බලතල ඃ

14. (1) බස්නාහිර පළාතේ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය හා පුළුල් කිරීම, නිෂ්පාදන ප්‍රවර්ධනයට දායකවීම සහ සියළුම සේවාවන් සැපයීම, රැකීරක්ෂා සම්පාදනයට අනුබල දීම සහ වැඩිදියුණු කිරීමට සහායවීම.

(2) දේශීය හා විදේශීය ආයෝජකයන් බස්නාහිර පළාතේ සංවර්ධනය සඳහා දායක කර ගැනීමට අවශ්‍ය ක්‍රම උපායන් සකස් කිරීම සහ දේශීය ආයෝජන දිරිමත් කිරීම.

කාර්යාංශයේ පරමාර්ථ

(3) ආයෝජන දිරිමත් කිරීමට යෝග්‍ය පහසුකම් සහ ආයෝජනයට හිතකර වාතාවරණයක් ඇති කිරීම.

(4) බස්නාහිර පළාතේ දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ ආදායම් ඉහළ නැංවීමට ඉවහල් වන ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ විෂයභාර පළාත් අමාත්‍යාංශ වෙත මාර්ගෝපදේශ ලබාදීම.

(5) ශ්‍රී ලංකාව තුළ වෙනත් ආයතන සඳහා වෘත්තිය උපදේශක සේවා සැපයීම.

(6) ආර්ථික ප්‍රවර්ධනයට අදාළ පර්යේෂණ සහ පුහුණු කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීම හා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.

(7) බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන ආයෝජන අවස්ථා, ඇති කිරීම, දේශීය හා විදේශීය ප්‍රතිපාදන ලබා ගැනීම, විශේෂ ව්‍යාපෘති සැලසුම් කිරීම.

(8) බස්නාහිර පළාතේ සංවර්ධනය සඳහා කෙටිකාලීන, මධ්‍යකාලීන සැලසුම් සකස් කිරීම.

(9) අවශ්‍ය අවස්ථාවලදී පළාත් සභාවේ අදාළ අමාත්‍යාංශවල සහභාගිත්වය ඇතිව පෞද්ගලික අංශය සමග ඒකාබද්ධව ව්‍යාපාර/ව්‍යාපෘති ආරම්භ කිරීම.

(10) මධ්‍යම ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයේ එකගත්වය ඇතිව විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම සහ මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම.

(11) ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ අරමුදල පවත්වාගෙන යාම සහ විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

(12) ආර්ථික ප්‍රවර්ධනය සඳහා රජයේ ආයතන, පෞද්ගලික ආයතන සහ පළාත් පාලන ආයතන සමග ගිවිසුම්වලට එළඹීමේදී අදාළ පළාත් අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.

15. (1) කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය හෝ හිතකර නැතහොත් ඊට ආනුෂාංගික කටයුතු කිරීමට කාර්යාංශයට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පිරිනමන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව-

(අ) කාර්යාංශයේ මුදල්වලින් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයන්, පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව සුදුසු යයි මණ්ඩලය සලකන, සුරැකුම්පත් හෝ තැන්පතු විෂයෙහි ආයෝජනය කිරීමට ;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට, දැරීමට, බද්දට හෝ කුලියට දීමට හෝ ගැනීමට, උකස්කිරීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ; කාර්යාංශයේ සාමාන්‍ය බලතල

(ඇ) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟ වීම්වලට කෙලින්ම හෝ පළාත් අමාත්‍යාංශය මාර්ගයෙන් හෝ කාර්යාංශයේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ ඇතුළත්වීමට සහ ඒවා ඉටු කිරීමට ;

(ඈ) ස්වකීය නිලධරයන්, සේවකයන් සහ සේවා සපයන්නන් පත්කිරීමට, ඔවුන්ගේ සේවය අවසන් කිරීමට, පාරිශ්‍රමික ගෙවීමට සහ පාලනය කිරීමට සහ එහි කටයුතු පරිපාලනය කිරීම හා සම්බන්ධ සියලු කාරණා මෙහෙයවීමට සහ තීරණය කිරීමට ;

(ඉ) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීමට ;

(ඊ) කාර්යාංශයේ පරමාර්ථ ඵල ගැන්වීම පිණිස ක්‍රම සකස් කිරීමට ;

(උ) පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය සහ ජාතික හා පළාත් සභා ප්‍රතිපත්තිවලට අනුකූලව අරමුදල්, තාක්ෂණය, විශේෂඥ ඥාණය හෝ වෙනත් ආධාර ලබා ගැනීම ;

(ඌ) කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා පළාත් භාණ්ඩාගාරයේ අනුමැතියට සහ ජාතික හා පළාත් සභා ප්‍රතිපත්ති වලට අනුකූලව, සේවා ව්‍යවස්ථා, විනය කාර්ය පටිපාටින් හා බඳවා ගැනීම් පටිපාටින් නියම කිරීම.

## **III** වන කොටස

### *කාර්යාංශයේ අරමුදල*

16. (1) කාර්යාංශය නමින් අරමුදලක් තිබිය යුතුය. එම අරමුදලට -

(අ) ප්‍රදාන වශයෙන් පළාත් සභාව විසින් කාර්යාංශයට විසර්ජනය කරන ලද මුදල් ;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ නියම කොට එකතු කරන ලද සියලු මුදල් ;

(ඇ) ගාස්තු සහ අයකිරීම් වශයෙන් කාර්යාංශය විසින් භාරගන්නා ලද සියලු මුදල් ;

(ඈ) කාර්යාංශය විසින් සිදු කරන ලද යම් ආයෝජනවලින් ලැබෙන ආදායම වශයෙන් කාර්යාංශය විසින් භාරගන්නා සියලු මුදල් ; සහ

(ඉ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියලු මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) (අ) මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ;

(ආ) කාර්යාංශයේ නිලධරයන්ට, සේවකයින්ට සහ සේවා නියුක්තියන්ට ගෙවිය යුතු වැටුප් ;

(ඇ) කාර්යාංශයේ සේවා සපයන්නන්ට ගෙවිය යුතු යම් දීමනා හා පාරිශ්‍රමික ; සහ

(ඈ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද යම් වියදම් සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(3) අරමුදලේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දස ලක්ෂ පහක් විය යුතු ය. ආරම්භක ප්‍රාග්ධනය මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වාරික ප්‍රමාණයකින්, පළාත් සභා අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, (1) උප වගන්තිය යටතේ පිහිටවනු ලැබූ අරමුදලට ඒ මුදල් බැර කරනු ලැබිය යුතු ය.

(4) කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(5) කාර්යාංශයේ අරමුදලේ භාරය, ඒ අරමුදලට මුදල් ගෙවීම, ගිණුම් තැබීම, අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒ කාරණා වලට සම්බන්ධ හෝ අනුයාත වෙනත් සියලු කරුණු අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති මගින් විධිමත් කරනු ලැබිය යුතු ය.

*ගිණුම් විගණනය කිරීම*

ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ වන්නේ ය.

අරමුදලේ ගිණුම් හා ඒ සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඔහු විසින් එය කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමග පළාත් සභාව ඉදිරියේ තැබීමට සැළැස්විය යුතු ය.

## IV වන කොටස
### *කාර්යාංශයේ කාර්‍ය මණ්ඩලය*

17. (1) ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කාර්යාංශය සලකන නිලධරයන් සහ සේවකයන් කාර්යාංශය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන නිලධරයන්ට සහ සේවකයන්ට කාර්යාංශය විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් සහ අනුප්‍රමාණ මත පළාත් භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, ඔවුන් කාර්යාංශය විසින් හා පළාත් සභාව විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) (අ) රජයේ සේවයේ නියුක්ත යම් නිලධාරියකු කාර්යාංශයේ ඉල්ලීම පිට ඒ නිලධාරියාගේ සහ අදාළ නිලධාරියාගේ පත්වීම් බලධාරියාගේ කැමැත්ත ඇතිව කාර්යාංශය නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(ආ) නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිස ගෙන තිබෙන යම් තැනැත්තකු කාර්යාංශය විසින් සේවයේ යොදවා ගනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් කාර්යාංශයේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## V කොටස
### *නිශ්චල දේපළ අත්කර ගැනීම*

18. (1) මේ ප්‍රඥප්තියේ අරමුණ සඳහා පළාත තුළ පිහිටි යම් නිශ්චිත දේපළක් අත් කර ගැනීමට අවශ්‍ය බව කාර්යාංශය අදහස් කරන විට දී අත්පත් කර ගැනීමට අපේක්ෂිත දේපළ සම්බන්ධයෙන් අදාල පළාත් විෂයභාර අමාත්‍යවරයාගේ ඉල්ලීම මත කරනු ලබන අමාත්‍ය මණ්ඩල නිර්දේශයන් මගින්

(අ) එකී දේපළ රජයේ දේපළක් වන විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ 9 වන උපලේඛනයේ I වන ලැයිස්තුවේ 2 පරිශිෂ්ඨයේ 1:1:2 විෂය යටතේ වූ කාර්යයක් සඳහා එකී දේපළ කාර්යාංශයට ලබා දෙන ලෙස;

(ආ) එකී දේපළ පෞද්ගලික දේපළක් වන විට, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ වූ කාර්යයක් සඳහා කාර්යාංශය වෙනුවෙන් මධ්‍යම රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් අත්පත් කර දෙන ලෙස ;
ඉල්ලීමේ යෝජනාවක් සම්මත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන යෝජනාවක් පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කර ඇති විට දී එකී යෝජනාව –

(අ) රජයේ දේපළක් සම්බන්ධයෙන් වන විට, එම දේපළ අයත් රජයේ ආයතනය වෙත ඉල්ලීමක් කළ යුතු ය ;

(ආ) පෞද්ගලික දේපළක් සම්බන්ධයෙන් වන විට, දේපළ අත්පත් කර ගැනීමේ පනත යටතේ රජයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා වෙත අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ලේකම් මගින් ඉල්ලීමක් කළ යුතු ය.

## VI කොටස

### *පොදු විධිවිධාන*

19. (1) මේ ප්‍රඥප්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට හා ගාස්තු අයකිරීමට අදාළ පහත සඳහන් සියළුම කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ පැවරෙන බලතල වලට හානියක් නොමැතිව, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූල නොවන රීති සෑදීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය :-

(අ) කාර්යාංශයේ රැස්වීම් කැඳවිය යුතු ආකාරය නියම කිරීම හා රැස්වීම් පැවැත්විය යුතු ආකාරය නියම කිරීම;

(ආ) කාර්යාංශයේ මූල්‍ය හා පරිපාලන කාර්ය පටිපාටින්;

(ඇ) කාර්යාංශයේ පරමාර්ථ ඉටුකිරීම පිණිස හා මෙම ප්‍රඥප්තිය යටතට ගැනිය හැකි කවර හෝ කාරණා සම්බන්ධයෙන්.

(2) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින හෝ ඒ රීතියේ සඳහන් යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය. රීති සෑදීමේ බලය

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක්ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවකට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් රීතියක්, ඒ අනනුමතයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද යම් කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

20. (1) කාර්යාංශයේ සියලු නිලධරයන් හා සේවකයන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සඳහන් විනය කාර්ය පටිපාටියට ඇතුළත් වන අතර, දණ්ඩ නීති සංග්‍රහයෙහි විධිවිධාන සම්බන්ධයෙන් රජයේ නිලධාරීන් සහ සේවකයින් ලෙස සැලකිය යුතු ය.

(2) කාර්යාංශය අල්ලස් පනතේ අර්ථානුකූලව උප ලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

21. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, "අමාත්‍යවරයා" යන්නෙන්, බස්නාහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ ආර්ථික ප්‍රවර්ධන විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

"මුදල් අමාත්‍යවරයා" යන්නෙන්, බස්නාහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

"අමාත්‍ය මණ්ඩලය" යන්නෙන්, බස්නාහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වේ.

"රජයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා" යන්නෙන්, රජයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය. අර්ථ නිරූපන වගන්තිය

"විෂයභාර පළාත් අමාත්‍යවරයා" යන්නෙන්, බස්නාහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ එක් එක් විෂය භාර පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

"ආයතන සංග්‍රහය" යන්නෙන්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ආයතන සංග්‍රහයේ II කාණ්ඩය අදහස් වේ.

22. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

02-397

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.